1. නියමු නොවන මාධ්‍යයක් යනු කුමක්ද?

   a) භෞතික මාධ්‍යයක් හරහා දත්ත සම්ප්‍රේෂණය කිරීම

   b) භෞතික මාධ්‍යයක් නොමැතිව වාතය හරහා දත්ත සම්ප්‍රේෂණය කිරීම

   c) විද්‍යුත් චුම්භක තරංග හරහා දත්ත සම්ප්‍රේෂණය කිරීම

   d) ආලෝක තරංග හරහා දත්ත සම්ප්‍රේෂණය කිරීම

2. වයි ෆයි (Wi-Fi) සහ බ්ලූටූත් (Bluetooth) ක්‍රියාත්මක වන්නේ කුමන තරංග මතද?

   a) ක්ෂුද්‍ර තරංග

   b) අධෝරක්ත කිරණ

   c) ගුවන් විදුලි තරංග

   d) ආලෝක තරංග

3. ක්ෂුද්‍ර තරංග සම්ප්රේෂණයේදී දත්ත ගමන් කරන්නේ කෙසේද?

   a) ඕනෑම දිශාවකට

   b) එක් රේඛාවකට

   c) චක්‍රාකාරව

   d) වෘත්තාකාරව

4. චන්ද්‍රිකා සම්ප්රේෂණයේදී දත්ත සම්ප්රේෂණය කරන්නේ කුමන ආකාරයටද?

   a) සෘජු රේඛාවකට

   b) චක්‍රාකාරව

   c) සම්ප්‍රේෂණ ප්‍රතිචාරක (transponders) හරහා

   d) ගුවන් විදුලි තරංග හරහා

5. චන්ද්‍රිකා සම්ප්‍රේෂණය සඳහා අහසේ රඳවා ඇති චන්ද්‍රිකා මධ්‍යස්ථාන පොළොවේ සිට කොපමණ දුරකින් පිහිටා තිබේද?

   a) කි.මී. 3600

   b) කි.මී. 36000

   c) කි.මී. 360000

   d) කි.මී. 360

LIVEWORKSHEETS

6. අධෝරක්ත කිරණ (Infrared) දත්ත සම්ප්‍රේෂණ මාධ්‍යයක් ලෙස භාවිතා කරන්නේ කුමන අවස්ථා වලදීද?

a) චන්ද්‍රිකා සම්ප්‍රේෂණයේදී

b) රූපවාහිනී දුරස්ථ පාලක සහ රැහැන් රහිත යතුරු පුවරු වලදී

c) වයි ෆයි සහ බ්ලූටූත් වලදී

d) ගුවන් විදුලි තරංග සම්ප්‍රේෂණයේදී

7. ක්ෂුද්‍ර තරංග සම්ප්රේෂණයේදී සම්ප්රේෂණ මධ්යස්ථාන එකිනෙකාට කෙසේ පිහිටා තිබිය යුතුද?

a) ඕනෑම ආකාරයකට

b) එකිනෙකාට දර්ශනය විය යුතුයි

c) චක්‍රාකාරව

d) එකිනෙකාගෙන් බොහෝ දුරින්

8. අන්තර්ජාලයේ සන්නිවේදනය සඳහා භාවිතා වන මාධ්යය කුමක්ද?

a) අධෝරක්ත කිරණ

b) ක්ෂුද්‍ර තරංග

c) චන්ද්‍රිකා සම්ප්‍රේෂණය

d) ගුවන් විදුලි තරංග

9. නියමු නොවන මාධ්‍යයන්ට උදාහරණයක් ලෙස පහත සඳහන් කුමක් දැක්විය හැකිද?

a) දෘශ්‍ය තන්තු

b) ඇඹරුණු යුගල කේබල්

c) සමාක්ෂක කේබල්

d) ගුවන් විදුලි තරංග

10. නියමු මාධ්යයක් යනු කුමක්ද?

a) භෞතික මාධ්‍යයක් නොමැතිව දත්ත සම්ප්‍රේෂණය කිරීම.

b) වාතය හරහා දත්ත සම්ප්‍රේෂණය කිරීම.

c) භෞතික මාධ්‍යයක් හරහා දත්ත සම්ප්‍රේෂණය කිරීම.

d) ආලෝක තරංග හරහා දත්ත සම්ප්‍රේෂණය කිරීම.

LIVEWORKSHEETS

11. නොවැසුණු ඇඹරුණු කම්බි යුගල (UTP) භාවිතා කරන්නේ කුමක් සඳහාද?

a) රූපවාහිනී ඇන්ටෙනා සඳහා.

b) CCTV කේබල් සඳහා.

c) දුරකථන සම්බන්ධතා සඳහා.

d) අන්තර්ජාල සම්බන්ධතා සඳහා.

12. වැසුණු ඇඹරුණු කම්බි යුගල (STP) නොවැසුණු ඇඹරුණු කම්බි යුගල වලට වඩා වෙනස් වන්නේ කෙසේද?

a) මිල අඩු වීම.

b) නම්‍යශීලි වීම.

c) දත්ත සම්ප්‍රේෂණ තත්ත්වය වර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම.

d) දුර ප්‍රමාණය වැඩි වීම.

13. සමක්ෂක කේබලයක (Coaxial cable) පිටත කේබලය කුමන ආකාරයෙන්ද?

a) තඹ කම්බි දැලක් ආකාරයට.

b) වීදුරු බටයක් ආකාරයට.

c) ප්ලාස්ටික් ආවරණයක් ආකාරයට.

d) තඹ කම්බි යුගලක් ආකාරයට.

14. ප්‍රකාශ තන්තු (Fiber optic) කේබලයක දත්ත සම්ප්‍රේෂණය වන්නේ කෙසේද?

a) විද්‍යුත් චුම්බක තරංග මගින්.

b) ආලෝකය පරාවර්තනය වෙමින්.

c) ක්ෂුද්‍ර තරංග මගින්.

d) ගුවන් විදුලි තරංග මගින්.

15. ප්‍රකාශ තන්තු කේබල් භාවිතා කරන්නේ කුමන ජාල වලද?

a) පැරණි දුරකථන ජාල වල.

b) නවීන දුරකථන ජාල වල.

c) රූපවාහිනී ජාල වල.

d) අන්තර්ජාල ජාල වල.

LIVEWORKSHEETS

16. නොවැසුණු ඇඹරුණු කම්බි යුගල (UTP) මීටර් කීයක උපරිම දුරකට දත්ත සම්ප්‍රේෂණය කළ හැකිද?

a) මීටර් 10

b) මීටර් 50

c) මීටර් 100

d) මීටර් 500

17. සමක්ෂක කේබලය භාවිතා කරන්නේ කුමක් සඳහාද?

a) දුරකථන සම්බන්ධතා සඳහා.

b) රූපවාහිනී ඇන්ටෙනා සහ CCTV කේබල් සඳහා.

c) අන්තර්ජාල සම්බන්ධතා සඳහා.

d) පරිගණක ජාල සඳහා.

18. ප්රකාශ තන්තු කේබලයක මධ්‍යස්ථය (core) සෑදී ඇත්තේ කුමකින්ද?

a) තඹ කම්බි වලින්.

b) වීදුරු බටයකින්.

c) ප්ලාස්ටික් ආවරණයකින්.

d) තඹ කම්බි දැලකින්.

19. දැනට පවතින වේගවත්ම දත්ත සම්ප්රේෂණ නියමු මාධ්‍යය කුමක්ද?

a) නොවැසුණු ඇඹරුණු කම්බි යුගල (UTP)

b) වැසුණු ඇඹරුණු කම්බි යුගල (STP)

c) සමක්ෂක කේබලය (Coaxial cable)

d) ප්‍රකාශ තන්තු (Fiber optic)

LIVEWORKSHEETS